# සදාචාර දර්ශනය හා සමාජය

ආචාර්ය නාමලි කුමාරි හඳගම

මිනිසා සහ මිනිස් හැසිරීම විෂය කරගත් සුවිශේෂ අධ්‍යයනයක් ලෙස සදාචාර දර්ශනය හැඳින්විය හැකිය. විවිධාකාර සමාජ පද්ධතීන් තුළ පවත්නා එකිනෙකට වෙනස් වූ ආචාර ධර්ම සදාචාර පිළිගැනීම් මෙන්ම ඒ ඔස්සේ හැඩ ගැසුණ, පුද්ගල හැසිරීම් රටාද අධ්‍යනය කිරීම සහ ඒ පිළිබඳව විමර්ශන කිරීම ආචාර විද්‍යාව ඔස්සේ සිදුවෙයි. මෙම විමර්ශනයන්ට අනුව සදාචාරය යන්න එක් අංශයකින් සමාජමය ක්‍රියාවලියකි. මේ පිළිබඳව ගැඹුරින් විමර්ශනය කළ සුප්‍රකට ආචාර දාර්ශනිකයෙකු වන විලියම් කේ. ෆ්‍රැන්කීනා සදාචාරය නම් කෘතියේ සඳහන් කරන පරිදි සදාචාරය යන්න තමාගේම මාර්ගෝපදේශකත්වය සඳහා පුද්ගලයා විසින් කරන ලද නිපදවීමක් හෝ සොයාගැනීමකී. එසේම ඔහු පෙන්වාදෙන පරිදි සදාචාරය වූ කලී කෙනෙකුගේ රාජ්‍යය, භාෂාව හෝ ආගම මෙන් පුද්ගලයාට පූර්වව පවතින්නකි. එමෙන්ම චර්යාවන් හැසිරවීමේ සමාජීය පද්ධතියක් වශයෙන් එක් අංශයකින් සදාචාරය නීතිය සහ සමානය. තව අතකින් එය සම්මතය හෝ චාරිත්‍ර විධි හා සමානය. Morality in the sense indicated is, in one aspect, a socal enterprise, it just a discovery or invention of the individual for his own guidance. Like one's language, state or church, it exists before the individual, who is inducted into it and becomes more or less of a participant in it, and it goes on existing after him. Moreover, it is not social merely in the sense of being a system governing the relations of one individual to others. Such a system might still be entirely the individual's own construction, as some part of one's code of action with respect to others almost inevitabily are…(W.K.Frankena (1963) මේ සඳහා භාවිත වන යෙදුම් ද, ඇතැම් විට සුවිශේෂය. හොඳ, යුතුකම, සාධාරණත්වය, යහපත, නිවැරදි බව එබඳු වචන කීපයකි. මෙම වචන භාවිතා කරමින් මිනිසා හා මිනිස් සමාජයේ අගය, වටිනාකම්, හැසිරීම් තීරණය කිරීමේදීත්, යහපැවැත්මට අනුබල දීමේදිත් අත්‍යවශ්‍යවූත්, තීරණාත්මකවූත් සාධකයක් ලෙද සදාචාරය යන්න ක්‍රියාත්මක වන බව කිව හැකිය.

මේ අනුව පොදුවේ පිළිගන්නා පරිදි සදාචාරය වූ කලී ජීවිතයේ සමාජමය සංස්ථාවකි. එහෙත් එය සමාජයේ පුද්ගල සාමාජිකයින් හට බුද්ධිමය ස්වයං මාර්ගෝපදේශකත්වයක් හෝ ස්වයං විනිශ්චයක් සඳහා අනුබල දෙන්නක් බවද සැලකේ. මේ සම්බන්ධව කරුණු දක්වන මැතිව් ආනල්ඩ් (Mative Arnold(1822-1888) කියා ඇත්තේ සදාචාරය යනු නීතියේ දෙපා අභියස ස්වයං පාලනයකින් යුක්තවීමට පුද්ගලයාට ආයාචනය කරන්නක් බවය. (Self-governed at the feet of law) මේ සියල්ලටම පදනම් වන්නේ කායික හා මානසික වු මිනිස් ක්‍රියාකාරකම්ය. හැසිරෙන ආකාරයන්ය. මෙබඳු මිනිස් ක්‍රියා, චරිත ලක්‍ෂණ, හොඳ, නරක වශයෙන් ඇගයීම් කළ හැකිය. එහිදි ක්‍රියාවන් යටතට දන්දීම, අසරණයන්ට පිහිටවීම, හිංසාව, මිනීමැරීම්, බොරුව, වැනි බාහිරව කැපී පෙනෙන චරිත ලක්‍ෂණද, එසේම මානසික ක්‍රියාකාරකම් ලෙස ද්වේෂය, ලෝභය, නපුරුකම, කරුණාව, දයාව, අනුකම්පාව, වැනි චිත්තවේගයන් ද ආචාර ධර්ම දෘෂ්ඨී කෝණයෙන් විමසිය හැකිය. ඒ සඳහා භාවිතා කරන සුවිශේෂ වචන මාලාවක් ද සදාචාර දර්ශන ක්ෂේත්‍රයේ දක්නට ඇත.

එනම්, හොඳ (good), නරක (bad), හරි (right), වැරදි(wrong), යුතු(ought), අ යුතු(not ought), බැඳීම (obligation), යුතුකම (duty), යුක්තිය (justice), සාධාරණත්වය (fairness) ඉන් කිහිපයකි. සදාචාරය පිළිබඳ සාකච්ඡාවන්ට අදාළ මෙබඳු වචන ආචාර ධර්මීය භාෂාවක් ලෙසද සැලකේ. (language of ethics). මෙසේ සුවිශේෂ භාෂාවක භාවිත වන වචන යොදා ගනිමින් පුද්ගල චාර්යාවන් පිළිබඳ ගැඹුරින් විමසීම ඇගයීම් කිරීම සදාචාර විමර්ශනයනිහීදී සිදු වේ.

නමුත් සදාචාර ඇගයීම් වල පවත්නා විශේෂත්වය වන්නේ පොදු එකඟතාවයන්ගෙන් බැහැරවීමය. එකිනෙකට වෙනස් සමාජ පසුබිම් තුළ සදාචාර පිළිගැනීම් වශයෙන් බොහෝ වෙනස්කම් ඇත. පුද්ගලයන් සහ ඔවුන්ගේ හැසිරීම් රටාවන් තුළ ද, එකිනෙකට වෙනස්කම් නොගැලපීම් ඇතිවා මෙන්ම, සදාචාරමය ප්‍රතිපත්ති පිළිබඳව ද පිළිගත්තා වූ ආචාර ධර්ම පද්ධතීන් අතරද මේ වෙනස්කම් පැහැදිලිවම දැකිය හැකිය.

නිදසුනක් ලෙස,

සත්ත්ව ඝාතනය - අහිංසක සතෙකු මරා ආහාරයට ගැනීම

අන්අයගේ පරිභෝජනය සඳහා සතුන් මැරීම.

මේ නොයෙක් ආකාරයෙන් සිදුකරණ සත්ව ඝාතන සදාචාර විරෝධි ලෙස දැකිය හැකිය.

විශේෂයෙන්ම ආගමික ඉගැන්වීම් අතර බෞද්ධ ආගමික සංකල්පනාවන්ට අනුව සත්ව ඝාතනය දැඩි සේ ප්‍රතික්ෂේප කරන්නකි. කෙනෙකුගේ ජීවිතයක් විනාශ කිරීම, ඒ සඳහා උත්සාහ කිරීම මෙන්ම සත්ව ඝාතනයක් සඳහා ඇතිකරගන්නා වූ සිතිවිල්ල පවා පාපයක්, වරදක්, සදාචාර විරෝධි දෙයක් ලෙස සැලකේ.

නමුත්, ක්‍රිස්තියානි හෝ ඉස්ලාම් ආගමික ඉගැන්වීම්වල සත්ව ඝාතනය හෝ සතුන් මරා ආහාරයට ගැනීම පිළිබඳ විශේෂයක් කොට සලකා හෝ පාපයක්, සදාචාර විරෝධි ක්‍රියාවක් සේ සලකා නැත. බයිබලය ඇතුළු ශුද්ධ ලියවිලිවල සඳහන් කරුණු අනුව සත්වයින් නිර්මාණය වී ඇත්තේ මිනිසාගේ අවශ්‍යතාවන් සඳහායැයි පිළිගැනේ. එසේම අප්‍රිකානු, ලතින් ඇමරිකානු වැනි ගෝත්‍රික සමාජයක සතකු මරා මස්කෑම ජීවිතයේ අනිවාර්ය කොටසක් මිස සදාචාර විරෝධි පහත් ක්‍රියාවක් වන්නේ නැත. දඩයමින් ජීවිත පෝෂණය කරගැනීම හා අන් අයව පෝෂණය කිරීම ජීවන පරමාදර්ශයක් මිස සදාචාර විරෝධි ක්‍රියා ලෙස නොසැලකේ. සත්ව හිංසනය හෝ සඳාචාරය සලකා සත්ව ඝාතනයන්ට එරෙහි වීමක් විරෝධය පෑමක් සිදුව නැත. සෑම අවස්ථාවකම මුල්තැන දී ඇත්තේ පුද්ගල මිනිස් ජීවිත පවත්වාගෙන යාම පෝෂණය කිරීම, ආරක්ෂා කරගැනීම යන්නට වීම මෙහි ඇති විශේෂත්වයයි.

නමුත් ක්‍රමයෙන් මිනිසාගේ සහේතුක ස්වභාවය දියුණුවත්ම, සංකීර්ණ සමාජ රීති සමූහයකට අවනත වීම, එකඟ වීම යන්න සිදුව ඇත. ඒ ඔස්සේ කිසියම් සදාචාර පිළිවෙත් හඳුනාගැනීම, අනුමත කිරීම, එකඟවීම යන්න සිදුවූ බව කිවහැකිය. එය මෙසේ සඳහන් කළ හැකිය.

මිනිසාගේ දැනුම හා විශ්වාස

ආවේදන

චර්යා නැඹුරුව

හොඳ නරක හඳුනාගැනීම

(යම් සමාජයක වැඩි දෙනා විසින් දරණු ලබන විශ්වාස සහ පරමාදර්ශ)

සාරධර්ම රාශියක් සංයෝග වීම

සදාචාරය බිහිවීම

සමාජ හා පුද්ගල අවශ්‍යතාවන් මත මෙසේ ගොඩනැගෙන සදාචාර පද්ධති පිළිබඳ වඩාත් සවිස්තරාත්මකව කරුණු විමසීමටත් ඒ යටතේ අදාල තොරතුරු පැහැදිලි කිරීමටත් හැකිය. මෙවන් විමර්ෂනයක් සම්පූර්ණයෙන්ම සමාජ විද්‍යාත්මක පදනමකින් කළ හැකිය. එනම් නිරීක්ෂණ හා පරීක්ෂණ සිදුකරමින් අදාල තොරතුරු ස්ථාපනය කර තහවුරු කිරීමත් තොරතුරු අනාවරණය කිරීමත්ය. එසේම ඇතැම්විට තොරතුරු අනාවරණය කිරීමෙන් නොනැවති ඒ පිළිබඳව නොයෙක් විග්‍රහයන් ද ඉදිරිපත් කළ හැක. සමාජ මානව විද්‍යාඥයින්ගේ කාර්ය එබඳු විස්තරාත්මක වූවකි. එනම් සැබෑ තොරතුරු සොයාබලා හෙළි කිරීමය. නමුත් එහිදී එම සාරධර්ම පද්ධති හොඳද නරකද යනුවෙන් විචාරයක යෙදීම, එම සදාචාර පද්ධතියේ පදනම පිළිගත හැකිද ? වෙන සදාචාර පද්ධතියක් පිළිගත යුතු ද? වඩා හොඳ වන්නේ කුමන සදාචාර පද්ධතිය ද? වැනි තීරණාත්මක විවරණයක් කිරීමට ඔවුන් පෙළඹෙන්නේ නැත. ඔවුහු පෙන්වා දෙන්නේ ඇති තත්වය පමණකි. සදාචාර අධ්‍යයන ක්ෂේත්‍රය සම්බන්ධව සමාජ හා මානව විද්‍යාඥයින් ඉටුවන්නේ ඒ අනුව විස්තරාත්මක කාර්යකි. එය සැබැවින්ම සදාචාර දාර්ශනිකයාගේ කාර්යයට වඩා වෙනස් වූවක් ද වේ.

සදාචාර දාර්ශනිකයන්ගේ මූලික උත්සාහය වූයේ, ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කිරීමටයි. අධිභෞතික සංකල්ප ඇසුරු කර ගෙන ඒවා සමර්ථය කිරීමට ඔවුන් විසින් දරන ලද උත්සාහය නිසා ආචාරාත්මක සංකල්පයන්ගේ යථා තත්වය පැහැදිලි කිරීමට බොහෝවිට ඔවුන් අසමත් වූ බැව් පෙනේ. ප්‍රාමාණික ආචාරධර්මයේ (Normative Ethics) පැවති මෙම මූලික දුර්වලතාවයන් ඇත් කිරීමට අධි ආචාර ධර්ම(Meta ethics) විග්‍රහයන් ඉදිරිපත්ව ඇත. අධි ආචාර දාර්ශනිකයන් විසින් සදාචාර සංකල්ප යන්න විවිධ ආකාරයෙන් විග්‍රහ කිරීමට තැත් කර ඇත. ප්‍රතිභානවාදය (Intuitinism: In avoiding the naturalist fallacy, Moor came to the conclusion that good, was a term that could not be defined or explained in terms of anything more basic that is why he is described as a

non-nationalist.) චිත්තවේගවාදය (Emotivism:The theory that moral assertions are simply the expression of values and emotions (i.e. to say that something is wrong or bad simply indicates that you dislike)- A.J.Ayer. ඒ අතරින් විශේෂයෙන් සඳහන් කළ හැකිය. මෙම විග්‍රහයන්ගේ මූලික සවරූපය බොහෝ දුරට වෙනස් වුවත්, පැහැදිලිව පෙනෙන ලක්ෂණය නම් එහි ඇති සමාජ විද්‍යාත්මක ස්වරූපයයි.

දාර්ශනිකයින් මෙන්ම සමාජ විද්‍යාඥයින් ද හඳුනාගත් පරිදි සදාචාරය බිහිවන්නේ සමාජය තුලිනි. සමාජය ප්‍රාථමික අවධියේ සිට දියුණු සමාජයක් කරා වර්ධනය විමේදී සදාචාරයේ මුහුණුවරද වෙනස් වේ. විශේෂයෙන්ම සමාජ ක්‍රියාකාරීත්වයේදී ඇති වන බාධා සදාචාරය මගින් ඉවත්කරනු ලැබේ.

උදා.- "බොරු කීම නරකයි''

මෙය සදාචාරාත්මක වන්නේ, බොරු කීමෙන් මුළුමහත් සමාජයටම අයහපතක් වන බැවිනි. මේ අනුව, සදාචාරාත්මක විනිශ්චයක් බොහෝ දුරට සමාජමය ආකල්පයන් හා සම්බන්ධ වේ.

ආචාරවාදී විග්‍රහයකදී දැඩි සේ බලපාන තවත් සමාජ විද්‍යාත්මක කරුනක් නම්, ඒ ඒ සමාජ සන්දර්භය තුලින් පුද්ගල පැවැත්ම කෙරෙහි කරනු ලබන බලපෑමයි. සී.එල්.ස්ටීවන්සන් (C.L.Steevanson 1908-1979) දක්වන පරිදි, සදාචාරාත්මක අගැයුමකදී අන් අයට ඒ පිළිබඳ කරනු ලබන බල කිරීමක්ද එමගින් අර්ථවත් වේ. උදා.- පිරිසිදු කමට අප කවුරුත් කැමතියි." එනිසා අප සෑම විටම පිරිසිදුව සිටිය යුතුය. මවක දරුවන් අමතා මෙවැනි ප්‍රකාශයක් කරනු ලබන අවස්ථාවකදී දරුවන් තුල, එම ක්‍රියාව සඳහා පෙළඹීමක් ද ඇති වේ.

උදා. - ''අසරණයින්ට පිහිටවීම හොඳයි"

අසරණයින්ට පිහිට වීම පිළිබඳ චිත්තවේගය පුද්ගලයා තුල හට ගන්නේ, ඔහු විවිධ සන්දර්භයන්ට ප්‍රායෝගික වශයෙන් මුහුණ දීමෙනි.

මෙවන් කරුණු සලකා බැලීමෙන් ආචාර ධර්මය සැකසෙන්නේ සිද්ධාන්ත ඉගෙනීමෙන් නොව ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයක් තුලින් බව හඳුනාගත හැකිය.

ආචාරවාදී විනිශ්චයන් පිළිබඳව පැන නගින ඊළඟ ප්‍රශ්නය නම්, ඒවා එකම පොදු පදනමක් යටතට පත් කල හැකි ද යන්නයි. ඇතැම් අවස්ථාවක, යම් ක්‍රියාවක් මට ප්‍රීතිය දනවනු ලබන දෙයක් වන නිසා මට එය යහපත් විය හැකිය. (Ethics is greatest pleasure) එහෙත්, සෑම අවස්ථාවකම "ප්‍රීතිය" ඇසුරු කර ගෙන "හොඳ" විග්‍රහ කල නොහැකි වේ. එය "හොඳ" විග්‍රහ කිරීමේ එක් අවස්ථාවක් පමණි.

උදා.- "වරදට දඬුවම් කිරීම හොඳයි"

මෙවැනි විනිශ්චයක් සදාචාරාත්මක වන්නේ, මෙහි ප්‍රීතිය ඇති කිරීමේ ලක්ෂණ අඩංගු වන නිසා නොවේ. ප්‍රීතිය ඇසුරින් මෙවැනි විනිශ්චයක් කිරීමට ගිය හොත්, එපමණින්ම එම ක්‍රියාව සාදාචාර නොවන එකක් බවට පත් වේ. එනම් කෙනෙක් විපතට පත් වනු දැක අන්‍යයන් සතුටට පත් වීමේ ලක්ෂන එවිට එහි අඩංගු වන බැවිනි. මෙවැනි සන්දර්භයකදී අප සදාචාරය තීරණය කල යුතු වන්නේ, වඩාත් ප්‍රවේශමින්ය. සදාචාරය යන්න ප්‍රතිඵලාත්මක අංශය සමග දැඩි ලෙස බැදී පවතින්ක් බව හඳුනාගත හැකිය.

මානව ආකල්පයන් විවිධ සන්දර්භයන්ට අනුව තීරණය වන ආකාරය තවත් උදාහරණයකින් දැක්විය හැකිය.

උදා.- මිය යාමට ආසන්න ලඟ ඥාතියකුගේ ආයාචනා ඉටු කිරීම.

මෙවැනි ක්‍රියාවක් "හොඳ" දෙයක් ලෙස ප්‍රතිභාඥානය ඇසුරින් අපට වටහා ගත හැකිය. මෙය යහපත් ක්‍රියාවක් ලෙස ප්‍රතිභානයට වැටහෙන්නේ, කෘතගුණ සැලකීම පිළිබඳ හැඟීම හෝ අනුකම්පාව නිසාය. මෙවැනි ක්‍රියාවක් සමාජ සන්දර්භය තුලින් ද අනුමත කරන දෙයකි. අනුන්ට පිහිට වීමෙන් යහපත් ප්‍රථිපල ඇති වූ විට, එය හොඳ ක්‍රියාවක් යයි ඒ හා සමාන සන්දර්භයන්ට මුහුණ දෙන හැම අවස්ථාවකදීම සිතනවා යයි සිතමු. ඒ හැම අවස්ථාවකම, එම ක්‍රියාව මට ප්‍රසන්න විය හැකිය. මෙවැනි ප්‍රායෝගික සන්දර්භයන්ට හුරු වූ පුද්ගලයා, තුල අන්‍යයන්ට පිහිට වීම නැමැති චිත්ත වේගයන් උපරිමයෙන් පවතින අතර, එය ඔහු ජීවත් වන සමාජ සන්දර්භයට අනුකූල වන නිසා, එම ක්‍රියාව කිරීම හෘදය සාක්ෂිය මගින්ද අනුමත කෙරේ. මෙවැනි සදාචාර ක්‍රියාවක් සමාජයේ අන් සාමාජිකයන් විසින් අනුමත කරන්නේ කුමන හේතුවක් පදනම් කර ගෙනද යන ප්‍රශ්නය ඊළඟට පැන නගී. මෙයට දිය හැකි එකම පිළිතුර නම්, සමාජයක් තුල එකට ජීවත් වන මිනිසුන්ගේ මානසික ආල්පයන් බොහෝ දුරට එක සමාන වන බවයි. එසේම එම සමාජයට ආවේණික සංස්කෘතික හා සමාජ කරුණු විසින්, පුද්ගල චිත්තවේග, හෘදය සාක්ෂිය, ප්‍රතිභාඥානය, වැනි ආචාරාත්මක විනිශ්චයකදී මූලික වන කරුණු කෙරෙහි දැඩි ලෙස බලපෑම් ඇති කරනු ලබන බවයි. "මිය යාමට ආසන්න ඥාතියෙකු වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමේදී, ''යුතුකම උදෙසාම එය කලා" යයි කීවත් එය අගැයීමේදී, විවිධ සංකීර්ණ කරුනු වල බලපෑම එයට ලැබෙන බව මේ අනුව පැහැදිලි වේ. "යුතුකම" පිළිබඳ චේතනාව, අපේ මනස තුලට ලැබෙන්නේ, සමාජය වෙතින් අප ලබන්නා වූ ප්‍රායෝගික අත්දැකීම් ආශ්‍රය කර ගෙනයි. මේ අනුව, ආචාරාත්මක විනිශ්චයකදී එයට පදනම ලෙස, විවිධ සන්දර්භයන්හිදී අප විසින් විවිධ කරුනු ගෙන හැර දක්වනු ලැබුවත්, තාර්කික වශයෙන් ඊට වඩා සංකීර්ණ පසුබිමක් පවතී. ආචාර විද්‍යාවේදී මෙම සංකීර්ණත්වය නොසලකා හැරීමේ දුර්වලතාවයට බොහෝ ආචාරවාදීන් හසු වූ බව පෙනේ. ආචාර ධර්මයේ පදනම් ස්වාභාවය වැරදි අන්දමින් වටහා ගැනීම නිසා සුඛ පරම වාදියා "ප්‍රීතිය" ආශ්‍රය කරගෙන හැම ආචාරාත්මක ප්‍රස්තුතයටම පොදු පදමක් ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇත. මේ නිසා, ඇතැම් ප්‍රායෝගික

ගැටලු වලට මුහුණ දුන් බව පෙනේ. (ප්‍රීතිය ආශ්‍රය කරගෙන විග්‍රහ කළ නොහැකි ආචාරාත්මක විනිශ්වයන් විග්‍රහ කල යුත්තේ කුමන පදනමක් මතද? ආචාරාත්මක සංකල්පයක් ඒ ඇසුරින් විග්‍රහ කල හැකිද) එමෙන්ම, තාර්කික යථානුභූතවාදී දාර්ශනිකයෙකු වූ ඒ.ජේ. එයර් *Language, Truth, and Logic* A.J.Ayer –(1910-1989) ආචාරාත්මක ඇගයුම් අර්ථශුන්‍ය ප්‍රකාශනයක් ලෙස හඳුන්වා දෙනු ලැබුවේද එහි ඇති සංකීර්ණත්වය නියම ලෙස වටහා නොගැනීමේ වැරැද්දට ඔහුද හසු වූ බැවිනි. (Wittgenstein's work was taken up by the Vienna circle of philosophers, who met during the 1920 and was made popular by A.J.Ayre's *Language, Truth and Logic* published in 1936. It is their development of Wittgenstein's ideas that is termed Logical Positivism. The logical positivist posed a serious threat to both religions and ethical language, branding both as meaningful ness because they failed the test of meaningfulness namely that a statement should either be true by definition or be capable of being proved true by empirical evidence.)

සදාචාර දර්ශන ක්ෂේත්‍රයේ ප්‍රතිභානවාදය හඳුන්වා දුන් මුල්ම සමකාලීන ආචාරවාදියා ලෙස සැලකෙන ජී.ඊ.මුවර්ගේ (*Principia Ethica,* G.E.Moor-(1873-1956) විග්‍රහය තුළින්ද ආචාරවිද්‍යාව පිලිබඳව අංග සම්පූර්ණ විග්‍රහයක් ඉදරිපත් වී යැයි සිතීම තරමක් අමාරුය. ආචාරාත්මක සංකල්ප අවිශ්ලේෂී වන බව ඔහු විසින් දක්වා ඇත. "හොද'' නම් සංකල්පය විශ්ලේෂණය කල නොහැකි බව සත්‍යයකි. එහෙත්, අප විසින් එවැනි සංකල්පයක් ග්‍රහණය කල යුතු වන්නේ තරමක වෙනස් ආකාරයටයි. ඒවා ඇගයුම්ශීලී විනිශ්වයන් වන නිසා, එවැනි සංකල්ප අප විසින් විස්තර කල යුතු වන්නේ ඒවා ක්‍රියාත්මක වන සන්දර්භයන්ට අනුකූලවය. Moor argued in Principia Ethica that the primary term good could not be defined in terms of other things, and did so in the context of calming that most earlier ethical thing had fallen into the 'naturalistic fallacy' of trying to derive an 'ought' from an 'is'. He came to the conclusion that goodness was not a natural property. You could not equal it with anything else, or give a description of it in terms of the thing. You man know what good is but you cannot define it.

G.E.Moor(1873-1958) *Principia Ethica,*

මෙසේ සාමාජික සන්දර්භයන්ට අනුකූල වන ලෙස විග්‍රහ කිරීමෙන්, සදාචාරාත්මක විනිශ්වයන්ගේ අර්ථ සම්පන්නභාවය විමසිය හැකි ය. එමෙන්ම එය හා සමාන සන්දර්භ හා ඒම සන්දර්භයන් තුලින් ගනු ලබන විනිශ්වයන්ට පදනම් වන විවිධ සාමාජික කරුණු ගැනද අවධානය යොමු කල හැකි වේ. මේ අනුව ආචාරාත්මක ඇගයුම් වල තාර්කික පදනම සෙවීමේදී එය විවිධ ප්‍රායෝගික සන්දර්භයන්ගෙන් ඈත් කොට විග්‍රහ කිරීමට යාම නුවණට හුරු කාර්යයක් වන්නේ නැත.

සාම්ප්‍රදායික ආචාර ධර්ම වාදීන්ගේ මූලික උත්සාහය වූයේ, වාස්තවික ආචාර ධර්ම පද්ධතියක් ගොඩ නැගීමයි. එසේම ඒවා සමර්ථනය කිරීමට උත්සාහගෙන තිබුනේ, අධිභෞතික සංකල්ප ඇසුරු කර ගෙනය. එමගින් ඔවුහු ඉතාමත් සරළ, පහසු සදාචාර විග්‍රහයක් ඉදිරිපත් කලහ.

එහෙත් 19 වන සියවසෙන් පසුව සිදුවන විශ්ලේෂී දර්ශනයේ පිවිසුමත් සමඟ, ආචාරාත්මක සංකල්පයන් විග්‍රහ කිරීම, සරළ අන්දමේ කාර්යයක් නොවන බව පැහැදිලි විය. විවිධ ආචාරවාදී විග්‍රහයන් පරීක්ෂා කර බැලීමේ දී, මූලික ගැටළු දෙකක් ආශ්‍රය කරගෙන එහි සංකීර්ණත්වය වැඩිවන බව හඳුනාගෙන ඇත. එනම්,

1. ආචාරාත්මක ප්‍රස්තුතයන් පිළිබඳව අර්ථසම්පන්න භාවයක් ඇත්ද?
2. එම විනිශ්චයන් පිළිබඳ තාර්කික පදනමක් දැක්විය හැකිද?

ආචාර විද්‍යාත්මක ප්‍රස්තුත වල තාර්කික පදනම පිළිබඳව විමසා බැලූ ස්වභාවවාදීන් (Naturalists) කියා සිටියේ, ස්වාභාවික ලක්ෂණ ඇසුරින්, ආචාරාත්මක ලක්ෂණ පහදා දිය හැකි බවයි. (ප්‍රීතිය වැනි ලක්ෂණ ආශ්‍රය කරගෙන). ස්වභාවවාදය (ආර්.බී.පෙරී/R.B.Peri). ස්වභාව ධර්මයට අයත් දෙයක් ලෙස සදාචාරය නිර්වචනය කළ ඔවුන් මිනිසුන් වඩාත් කැමති කුමකටද යන්න මත, සියල්ල තීරණය වන බව කියා ඇත.

සදාචාර දර්ශනය ක්ෂේත්‍රයේ ගොඩනැගුනා වූ ප්‍රතිභානවාදය, චින්තවේගවාදය, උපයෝගීතාවාදය, යුක්ත්‍යාත්මවාදය, විධානවාදය ආදී වූ සියළු වාද අසතුටුදායක හා අසම්පූර්ණ කියූ ස්වභාවවාදින් සදාචාර දර්ශන ක්ෂේත්‍රයේ නවතම වාදයක් ලෙස මෙම වාදය ඉදිරිපත් කර ඇත. මෙම නවතමවාදය ස්වභාවවාදය ලෙස හැඳින්වීමට හේතුව වූයේ ද විශේෂ කරුණකි. එනම්, ආචාර දර්ශන ක්ෂේත්‍රයේදී අප යමක හොඳ නරක ගැන කථා කරන්නෙමු එසේම අප බොහෝවිට හොඳ නරක යන්න ස්වභාවික නිරීක්ෂණයෙන් හඳුනාගත හැකි දෙයක් ලෙස ද විශ්වාස කරන්නට පෙළඹී ඇත. එනිසාම ස්වභාවික පැවැත්මකට අනුව හොඳ යන්න විශ්ලේෂණයටද උත්සාය ගනී. ස්වභාවවාදීන් දක්වන ලෙස හොඳ යන්න ස්වභාව ධර්මයට අයත් දෙයකි. මිනිසුන් වැඩිපුර කැමති වන්නේ කුමක් ද යන්නත් එය අපට පැහැදිළිවම දැක්විය හැකිය යන්නත් ස්වභාවවාදින්ගේ අදහසයි. නමුත් ජී.ඊ.මුවර්, අර්.එම් හෙයා, සි.එල්.ස්ටීවන්සන් වැනි අය එම අදහස ප්‍රතික්ෂේප කරති. ස්වභාවවාදීන්ගේ ඉහත අදහස ආභාෂයන් වරදක් වූ බව ද ඔවුහු පෙන්වා දී ඇත. සදාචාර දර්ශන ක්ෂේත්‍රයේ ස්වභාවවාදී ආභාෂය (Naturlistic fallacy) වන්නේ එයයි. මෙම ස්වභාවවාදී ආභාෂයෙන් මිදී හොඳ නරක ගැන විග්‍රහ කළ යුතු බව ඔවුහු පිළිගනිති

උපයෝගීතාවාදීන් (Uteliterianist), ආචාර විද්‍යාවේ භාවිතා වන "හොඳ'' සංකල්පය වැඩිම දෙනාගේ උපරිම සැපත ආශ්‍රය කරගෙන නිර්වචනය කර ඇත. ප්‍රතිඵලාත්මක අංශය මත සදාචාරය විග්‍රහ කිරීමට යාම මොවුන්ගේ මූලික ලක්ෂණයයි. Mill suggested a positive place for rules with in an overall utilitiranian approach. To use own example, he argue that society needs the principle of truthfulness, without which nobody would ever be able to trust anybody to be telling the truth is a means of securing the greatest happiness. For the greatest number within society as a whole. To tell a lie might therefore offer immediate advantages to those concerned but that should be weighted against the more general threat to society if telling lies because the norm.)- John Stuart Mill (1806-1873)

ජෙරමි බෙන්තම්ගේ උපයෝගීතාවාදයේ හරය වන්නේ යහපතෙහි විශාලතම අතිරික්තයක් බිහි කරන ක්‍රියාව (අයහපත සමඟ සැසඳීමේදී අයහපතෙහි අවමයක්) අප විසින් ඉටු කළ යුතු බවයි. එනම් වැඩි දෙනාගේ වැඩි යහපත වෙනුවෙන් අප ක්‍රියාකළ යුතු බව උපයෝගීතාවාදයෙන් අදහස් වේ.

පරිමාණ හතකට අනුව සුඛය සහ දුක්ඛය පිළිබඳව සුඛ වින්දනාත්මක කලනයක් ජෙරමි බෙන්තම් විසින් සැකසීමට යත්න දැරීමේදී මෙය ඉතා පැහැදිලිව විද්‍යාමාන වෙයි.

ආචාරවාදී සංකල්ප පිළිබඳව චිත්තවේගවාදීන් (Emotivists) කියා සිටියේ, ආචාරාත්මක විනිශ්චයන් තුල චිත්තවේගාත්මක අංශය කැපී පෙනෙන ලක්ෂණයන් වන බවයි. මේ අනුව, සදාචාරාත්මක විනිශ්චයන් ගේ තාර්කික පදනම පිළිබඳ විවිධ අන්දමේ විග්‍රහයන් කරනු ලැබ ඇත. මෙම විග්‍රහයන් සදාචාරාත්මක ප්‍රස්තුතයන්ගේ තාර්කික පදනම විග්‍රහ කිරීමෙහිලා කෙතෙක් දුරට සෑහේද? නොසෑහේ නම් එයට ප්‍රමාණවත් විසඳුමක් දැක්විය හැකිද? යන ප්‍රශ්නය මෙහිදී වැදගත් වේ. (Emotivism: The view that ethical statement are merely expressions of approval or disapproval. A.J.Ayer argued for a theory about the nature of ethical statement that because known as emotivism.)

මේ සඳහා සිදුකරන විග්‍රහයන්හිදී, සදාචාරාත්මක විනිශ්චයන් අංශ 2 කට බෙදා විග්‍රහ කල හැකිය.

1. විස්තරාත්මක කරුණු (Discriptive Facts)
2. ඇගයුම්ශීලී කරුණු (Value judgements)

මෙහි එන විස්තරාත්මක අංශයට නිදසුනක් ලෙස "පියදාස හොඳ ළමයෙකි." යන්න දැක්විය හැක. ''වැඩට දක්ෂ කෙනෙකු වන නිසා'', පියදාස හොඳ යැයි කිව හැකිය. එය "පියදාස හොඳ ළමයෙකි'' යන ප්‍රස්තුතයේ විස්තරාත්මක අංශය වේ. ඇගයුම්ශීලී අංශය හොඳ යන්නෙහි අඩංගු වේ. සදාචාරාත්මක ඇගයුමකට බොහෝ දුරට පදනම් වන්නේ, එහි අඩංගු විස්තරාත්මක අංශයයි. මෙය උදාහරනයකින් පැහැදිලි කල හැකිය. මුදල් වලින් ලැබෙන ඵල ප්‍රයෝජන වලට කෙනෙක් ආශා කරයි. ඒ තුලින් මුදල් වලට ඇගයුමක් ඔහුගෙන් ලැබෙයි. එම ඵල ප්‍රයෝජන වලට ඇති ආශාව නිසාම, ඔහු මුදල් එක් රැස් කිරීමට පටන් ගනී. පසුව ඔහු එම මුදල් වලින් ලැබෙන ඵල ප්‍රයෝජන වලට ඇති ආශාව මුදල් වලට ආරෝපණය කරයි. මෙම අවස්ථාවේදී, ඔහු මුදල් වලට ආශා කරන්නේ මුදල් වන නිසාමය. සදාචාරය තීරණය වන්නේද මෙසේමයි. අපට බොහෝ අවස්ථාවල"යමක් හොඳ වන්නේ එය හොඳ වන නිසා'' යැයි පිළිතුරු දෙන සන්දර්භයන් හමු වේ. එහෙත් එවැනි විනිශ්චයක පදනම, අප විවිධ අවස්ථා වල විවිධ සන්දර්භයන් තුලදී ලබන ප්‍රායෝගික අත්දැකීම්ය. එම ප්‍රායෝගික අත්දැකීම් වලදී යම් ක්‍රියාවකට ඇගයුමක් ලැබෙන්නේ එහි විස්තරාත්මක අංශයේම ප්‍රතිපලයක් ලෙසිනි. මුදල් වල ඵල ප්‍රයෝජන තකා මුදල් රැස් කළ පුද්ගලයා පසුව, මුදල් වන නිසාම එය ඇගයුම් කලා සේම, සදාචාරයද විස්තරාත්මක අංශය මත අගැයුම් කොට පසුව එය

සදාචාරය වන නිසාම අගයන අවස්ථා ආචාර විද්‍යාවේදී දක්නට ලැබේ. ''මට" "A'' නැමති ක්‍රියාව යහපත් බව මගේ ප්‍රතිභානයට වැටහෙනවා" කියා කෙනෙක් කීවොත්, එයින් අර්ථවත් වන්නේ, ඔහු කලින් අත්දුටු සන්දර්භවල ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලයාට යම්කිසි ඥාන ශක්තියක් තිබෙන බවයි. මෙම ප්‍රතිභානය ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ ප්‍රථිපලයක් වශයෙන් පුද්ගලයාට ලැබෙන්නකි. මේ අනුව සදාචාරයට පදනම වන්නේ, විවිධ අවස්ථා වල විවිධ සන්දර්භයන්හිදී ඔහු ලබන අත්දැකීම්ය.

සදාචාරාත්මක විනිශ්චයක(Moral Judgement) අඩංගු දෙවැනි ලක්ෂණය නම්, ඇගයුම්ශීලී භාවයයි. අපි විවිධ සන්දර්භයන්හිදී සදාචාරාත්මක අගැයුමක් සඳහා විවිධ හේතු දක්වමු.

උදා. - "මට ඒක ප්‍රසන්න දෙයක්, ඒ නිසා එය හොඳයි"

"මගේ හෘදය සාක්ෂියට ඒ ක්‍රියාව අනුකූලයි, ඒ නිසා එය හොඳයි"

''මගේ චිත්තවේගාත්මක තත්වයට එම ක්‍රියාව අනුකූල දෙයක්, ඒ නිසා එය හොඳයි''

"මගේ ප්‍රතිභානයට එම ක්‍රියාව හොඳ බව මට වැටහෙනවා"

විවිධ සන්දර්භයන්හිදි මෙසේ ප්‍රසන්නතාවය, හෘදය සාක්ෂිය, චිත්තවේග, ප්‍රතිභාඥානය වැනි කරුණු වලින් අප අර්ථවත් කරන්නේ කුමක්ද ? සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් (Sigmaund Freued-1856-1939) නැමැති මනෝ විශ්ලේෂණවාදියා දක්වන පරිදි, හෘදය සාක්ෂිය වැනි කරුණු පුද්ගලයා, තුළ ඇති වන්නේ, කුඩා කල සිට ඔහු "පවුල" ඇසුරින් ලබන අත්දැකීම් පදනම් කරගෙන ය. යම්කිසි ක්‍රියාවක්, චිත්තවේගාත්මක තත්වයක් මත ඇගැයීමේදී සිදු වන්නේ එවැනිම තත්වයකි. එම චිත්ත වේගාත්මක තත්වයන්, ඔහු විවිධ සන්දර්භයන් තුළ ලද අත්දැකීම් මත හා පරිසරයේ බලපෑම් මත තීරණය වේ. (Sigmund Freud (1856-1939):Hugely influenced as a result of his work on the unconscious mind and establishing psychoanalysis as a method of unlocking repressed experiences. Freud has change the way people think about themselves, even where his specific ideas are challenged. He assessed religions beliefs and practices in terms of people's emotional and psychological needs.)

ඉමැනුවෙල් කාන්ට් (Immanuel Kant-1724-1808) නම් දාර්ශනිකයා සදාචාරය පිළිබඳව කල විග්‍රහය, මෙහිදී උපුටා දැක්වීම උචිත ය. ''හැසිරීම පිළිබඳ දැක්විය හැකි ප්‍රතිපත්තිය කෙසේ විය යුතුද යත්, තමන්ගේ හැසිරීම පිළිබඳ යුක්ත්‍යාත්මවාදී ප්‍රතිපත්තිය සදාචාරය ලෙස පිළිගන්නා කෙනෙකුට, එය අන් සෑම කෙනෙකු විසිනුත් ඔවුන්ගේ හැසිරීම පිළිබඳ ප්‍රතිපත්තිය බවට පත් කර ගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුයයි විශ්වාස කළ හැකිය''. එනම් ස්ථිරව ප්‍රාර්ථනා කර ගෙන කටයුතු කිරීම එහිදී සෑහේ. අන් අයද තමා මෙන්ම සලකා කටයුතු කළ යුතු බව බෞද්ධ ආචාරවාදයෙන් ද කියැවේ. කාන්ට් කියා සිටියේ සදාචාරාත්මක ක්‍රියාවක් කරන විට, එහි ප්‍රතිඵලය ගැන නොසලකා

යුතුකම උදෙසාම යුතුකම් කළ යුතු බවයි. අවිහිංසාව, කරුණාව, දයාව, වැනි දේ ගැන අපට කතා කල හැක්කේ එවිටයි. මිනිසත් බව ගරු කරන එවැනි සදාචාරයක් දියුණු සදාචාරයක් ලෙසටත්, එසේ නොවන ඒවා නොදියුණු සදාචාරයක් හැටියටත් වගී කිරීමට මෙම මිණුම් දණ්ඩ යටතේ කළ හැකිය.

(Immanuel Kant(1724-1808)-Kant's moral theory was based on principles of practical reason, rather than on a utilitarian assessment of the expected results of an action. He started with the awareness of a moral 'ought' and aimed; to seek out and establish the supreme principal of morality.)

කාන්ට් සෑම අවස්ථාවකදීම තහවුරු කරන්නට උත්සාහ කළේ සාදාචාරාත්මක ක්‍රියාවන්හිදී යුතුකම පෙරදැරිව පමණක් ක්‍රියා කළ යුතු බවය. මේ නිසාම ඔහු හඳුන්වා දුන් සදාචාර න්‍යාය ප්‍රධාන තේමාවන් තුනකට සීමාවන බවක් හඳුනාගත හැකිය. එනම්,

1. සර්ව සාධාරණත්වය නමැති ආප්තය යටතේ පමණක් ක්‍රියා කළ යුතුය.
2. මනුෂ්‍ය වර්ගයා නිෂ්ඨාවක් ලෙස මිස උපායමාර්ගයක් ලෙස භාවිත නොකළ යුතු බව.
3. යහපත් අධිෂ්ඨානය පමණක් අගය කළ යුතු බව.

මෙවන් අදහස් තුළින් ඔහු අපේක්ෂා කළේ සදාචාර ජීවිතයේ දී කිසිවිටෙකත් තමා විශේෂයක් කොට නොසලකා ක්‍රියා කිරීමත් මිනිසා තමාගේ මනුෂ්‍ය සංහතිය වෙනත් බාහිර ප්‍රයෝජනයන් සඳහා උපාය මාර්ගයන් ලෙස භාවිත නොකළ යුතු බවයි.

චිත්තවේගවාදයෙහි පැවති දුර්වලතා වටහාගැනීම හේතුවෙන් ආර්.එම්.හෙයා විසින් විධානවාදී න්‍යාය (Prescriptivism:R.M.Hair) සදාචාර දර්ශනයට හඳුන්වා දී ඇත. හෙයා විසින් විධානවාදය ඉදිරිපත් කිරීමේදී චිත්තවේගවාදීන් පිළිගත් අයුරින්ම සදාචාර විනිශ්චය සහ මිනිස් හැසිරීම අතර ආසන්න සබඳතාවක් ඇතැයි පිළිගනී. එනම් මේ දෙපිරිසම පිළිගන්නා ආකාරයට ආචාර ධර්ම විනිශ්චය වූ කලී මිනිසා යම්කිසි හැසිරීමකට යොමු කරන්නකි, පොළඹවන්නකි. ආචාරධර්ම විනිශ්ච වූ කලී උදාසීන විනිශ්චයන් නොවන බව ඒ අනුව චිත්තවේගවාදීන්ගේ මෙන්ම විධානවාදීන්ගෙ ද පිළිගැනිමයි. නමුත් විධානවාදීන් චිත්තවේගවාදියෙකු වූ සී.එල්.ස්ටීවන්සන්ගේ මතයන් සමග එකඟ වන්නේ නැත. එනම් ආචාර ධර්ම විනිශ්චයත් මිනිසුන්ගේ ක්‍රියාකාරිත්වයත් අතර ඇති සම්බන්ධය මනෝවිද්‍යාත්මක සම්බන්ධයක් ය යන අදහස විධානවාදීහු තරයේ ප්‍රතික්ෂේප කරති.

ආර්.එම්.හෙයා, සදාචාරයේ භාෂාව (*Language of Ethics*, 1952) නම් කෘතියෙහි සඳහන් කරනුයේ යම් කෙනෙකුට යමක් කිරීමට යෙදවීමත් (යම් ක්‍රියාවක නිරතකරවීමත්) යම් කෙනෙකුට යමක් කරන්නට අණකිරීමත් අතර ලොකු වෙනසක් ඇති බවය.

චිත්තවේගවාදීන් පිළිගන්නා පරිදි සදාචාරාත්මක භාෂාව වූ කලී කිසියම් බලපෑමක් වැනි කාර්යයක් කරන්නකි. එනම් ආචාර ධර්ම විනිශ්චය සහ මිනිසුන්ගේ ක්‍රියාකාරීත්වය අතර සම්බන්ධයක් චිත්තවේගවාදීන් පිළිගනී.

නමුත් හෙයාගේ අදහස වූයේ සදාචාරාත්මක භාෂාව මඟින් එසේ කරවීමක් බලාපොරොත්තු නොවන බවය. සදාචාර විනිශ්චයන්හි ඇත්තේ යමක් කරන්නට කීමක් පමණක් බව පෙන්වා දුන් හෙයා, ඒවා විධානයන් හෝ නිර්දේශයන් පමණක් බවද පෙන්වා දී ඇත. එනිසාම සාදාචාරාත්මක භාෂාව නම් නිර්දේශාත්මක හෝ විධානාත්මක භාෂාවක් බව විධානවාදිහු පිළිගනිති. මෙසේ චිත්තවේගවාදීන් මෙන්ම විධානවාදීන් ද සදාචාරාත්මක විනිශ්චය එක්තරා, ඇගයුම්ගීලි වර්ගයක විනිශ්චය ලෙස සලකන අතරම, ඒවායින් නිර්දේශ හෝ විධාන ගම්‍යවන බවද පිළිගනී. මේ පිළිබඳව වැඩිදුරටත් කරුණු දක්වන හෙයා සාදාචාරාත්මක භාෂාවේ අපේක්ෂාව යමක් කරවීමක් නොවන බව පෙන්වා දෙයි. එහි ඇත්තේ යමක් කරන්නට කියා කීමක් පමණකි. යමක් කරවීම ආයුධයක් පෙන්වා වුවද කළ හැක. හෙයා පෙන්වා දෙන පරිදි සදාචාරාත්මක කියමනකින් විධිවාක්‍යක් ගම්‍ය වීම එහි තාර්කික ලක්ෂණයකි. නමුත් තාර්කික ලක්ෂණ අනුව මිස මනෝවිද්‍යාත්මක ලක්ෂණ අනුව සදාචාර නියමනක් හඳුනාගත නොහැකිය.

එසේම, සදාචාර විනිශ්චයන් තුළ ප්‍රායෝගික නැඹුරුවක් ඇත. ඒවා මිනිස් ක්‍රියාකාරිත්වය, හැසිරීම සම්බන්ධව ක්‍රියාකාරීව පවතී. උදාසීනව නොපවති. ඒවා පිළිතුරු සපයන්නේ මම කුමක් කරන්නද යන පැනයටයි. විද්‍යාත්මක කියමන් පිළිතුරු සපයන්නේ පවත්නා තත්වය කුමක් ද, යන පැනයට (what is the case) සදාචාරාත්මක කියමන් පිළිතුරු සපයන්නේ මම කුමක් කරන්නද? (What shall I do?) මේ අනුව, යම් කාර්යයක් හා තාර්කිකව සම්බන්ධවන භාෂා ව්‍යාවහාරයක් ලෙස සදාචාරාත්මක වචන ව්‍යවහාරය සැලකිය හැකිය. [විධානවාදියෙකු ලෙස හෙයා චිත්තවේගවාදය ප්‍රතික්ෂේප කළේද මෙවන් සිදුවීම් නිසාය. චිත්තවේගවාදියෙකු ලෙස ස්ටීවන්සන් සදාචාරාත්මක භාෂාව එක්තරා බලපෑමක් කිරීමට සමත් භාෂාවක් ලෙස පිළිගනී. හෙයා එය ප්‍රතික්‍ෂෙප කරයි. එනම් සදාචාරාත්මක භාෂාව ආයුධයක් පෙන්නා කරන විධානයකට සමාන නැත.] සදාචාර භාෂා ස්වරූපය වූ කලී මාර්ගෝපදේශකත්වය ලබාදෙන භාෂා ස්වරූපයකි. (Language of guidance) එමගින් හැසිරීමට මඟ පෙන්වයි. එමගින් සදාචාර ක්‍රියා කරවන්නේ නැත. ඊට මඟ පෙන්වීමක් පමණක් කරයි. හෙයාට අනුව සදාචාරාත්මක භාෂාව බුද්ධිගෝචර වූවකි.

එසේම, ආචාරධර්ම ක්ෂේත්‍රයේ කෙරෙන විනිශ්චයන්ට අදාල වැදගත් තාර්කික ලක්ෂණයකි එම ආචාර ධර්ම විනිශ්චයන් විශ්ව සාදාරණකරණීය විනිශ්චයන් වීම. එසේම හෙයාගේ විශ්ලේෂණයට අනුව සියලුම ආචාර ධර්ම ප්‍රකාශනයන් විධිවාක්‍ය ඝණයට වැටෙන්නකි.

''දොර වසන්න''

''සුරා පානය නොකරන්න''

''රාත්‍රියට ආහාර නොයන්න''

මේවා බොහෝ දුරට විධානාත්මක භාෂාවකට සමානය. නමුත් හෙයා පවසන ආකාරයට විධානාත්මක භාෂාව සාමාන්‍ය විධානවලින් වෙනස්ය. එනම් ආචාරාත්මක විධානයකින් ආචාරාත්මක නොවන විධානයන් වෙනස්ය. එසේ වන්නේ ආචාර විද්‍යාත්මක සන්දර්භයක කෙරෙන විධාන විශ්වසාධාරණ විධානයක් වන නිසාය.

| | | |
|---|---|---|
| දොර වසන්න | - | විශේෂ අවස්ථාවකට සීමාවේ |
| වෙඩි තබන්න | - | යුධ සේනාංකයකට සීමාවේ |
| අන්සතු දෙයක් සොරා නොගන්න | - | ආචාර ධර්ම සම්බන්ධ විධානයකි (විශ්ව සාධාරණ කරණීය වුවකි) |

[විශ්වසාධාරණකරණීය ආචාර ධර්ම විනිශ්චය යනු යම් තත්ත්වයක් යටතේ ආචාර ධර්මය හා සම්බන්ධ විධානයක් හෝ නිර්දේශයක් කිරීමෙන් නිර්දේශ කරන්නා ඇතුළු සියලු බුද්ධිමත් සත්වයින්/මිනිසුන් ඊට සමාන තත්වයන් යටතේ ඒ විධානයට අනුව කටයුතු කළ යුතු බව ගම්‍යවන්නකි.] මෙබඳු ගම්‍යතාවන් ආචාරධර්ම නිර්දේශවල ඇත. එහි එන නිර්දේශයන්, විධානයන් බලසම්පන්න කෙනෙක් තමන්ට අවශ්‍ය කාර්ය තව කෙනෙකු ලවා ඉටුකර ගැනීමටකට කරන ආඥාවකට, විධානයකට සමාන නැත. එවන් විධානයක දී විධානය හෝ ආඥාව නිකුත් කරන්නා අදාළ කාර්ය සිදු කිරීමට බැඳී නැත.

| | | |
|---|---|---|
| සෙන්පතියෙකු සොල්දාදුවන්ට | - | වෙඩි තැබීමට දෙන අණක් |
| ස්වාමියා සේවකයෙකුට | - | දොර වසන්න දෙන නියෝගයක් |

මෙහිදී පණිවුඩය, ආඥාව නිකුත් කරන්නා විසින් එම කාර්යය කිරීමක් අපේක්ෂා නොකරයි. නමුත්, සදාචාරාත්මක විධානයන්ට, නිර්දේශයන්ට එම විධානය හෝ නිර්දේශය පිළිපැදීමට, ඉටු කිරීමට අදාළ විධානය කරන පුද්ගලයා ද අනිවාර්යෙන්ම බැඳී සිටී. එය විශ්වසාධාරණ කරණීය විධානයක හෝ නිර්දේශයක සැබෑ ස්වරූපයද වේ. හෙයා පෙන්වාදෙන පරිදි ආචාරධර්ම ක්ෂේත්‍රයේ එකඟතාවන් වූ කලී සමාන රුචිකම්, මානසික නැඹුරුකම් ඇති මිනිස් වර්ගයා අතර බිහිවිය හැකි දෙයකි. යම් අදහසක් ආචාර ධර්ම නියමයක් සේ පනවන විට ඊට තමා ද බැඳී සිටින නිසා, කෙනෙකු නිර්දේශ කරන්නේ තමාටද අවනත විය හැකි ආකාරයේ නියමයන්ය. එය ස්වභාවයෙන්ම සිදුවන්නකි. මා කිසියම් නියමයක් පිළිගන්නේ ජීවන ප්‍රතිපත්තියක් ලෙසය (Principle of living). එහිදි සියල්ලෝම අනුමත කරන මට ද එකඟවිය හැකි ප්‍රතිපත්ති මා තෝරාගත යුතුය. එම ප්‍රතිපත්තියේ හෝ නියමයේ ප්‍රතිඵල අන් අයට බලපාන අයුරින් මටත් බලපාන බවත්, මමද ඊට අවනත විය යුතු බවත් දැන සිටිය යුතුය. (අන් පුද්ගලයන්ගේ තත්වයට තම මනස ගෙනගොස් පොදු දෘෂ්ටියකින් එදෙස බැලිය යුතුය. ස්වභාවික විද්‍යා ක්ෂේත්‍රයේ උපන්‍යාස ගොඩනැගීමකට මෙය සමානය). ආචාර ධර්ම ප්‍රතිපත්ති පැනවීමේදී අන්‍ය මිනිස් හැඟීම් ගැන අවබෝධයකින් යුක්තව තමාටත් පිළිගත හැකිනම් පැනවිය යුතු වීම මෙහි ඇති විශේෂත්වයයි.

ප්‍රතිභානයද (Intution) මෙසේමය. එයද පුද්ගලයන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයෙන් ඔහුට ලැබෙන්නකි. මෙහිදී ද වැදගත් වන්නේ ඔහු සමාජ ලෝකය තුල මුහුණ දෙන විවිධ සන්දර්භයන්ය.

සී.ඩී.බ්‍රෝඩ් (C.D.Braod-1887-1977) දක්වන පරිදි, "ආචාර විද්‍යාවේ ඇගයුම්ශීලි විනිශ්චයන්ට පදනමක් ලැබෙන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය තුලිනි. මෙම අත්දැකීම් පදනම් කර ගෙන, ආචාර විද්‍යාත්මක විනිශ්චයන්ට පොදු පදනමක් ඉදිරිපත් කළ හැකිද ? යන ප්‍රශ්නය ඊලඟට වැදගත් වේ.

උදා. ''අසරණයෙකුට පිහිට වීමෙන් ඔහු කලේ හොඳ වැඩක්"

''බොරු කීමෙන් වැලකීම හොඳයි''

''මත් පැන් පානය හොඳයි"

මෙම වාක්‍ය තුනෙහි අඩංගු "හොඳ" විවිධ ආකාරයට විග්‍රහ කළ හැකිය. මුල් වාක්‍යය විමසා බලන කෙනෙක් ප්‍රතිභානය ආශ්‍රිතව එය "හොඳ" බව වටහා ගැනීමට ඉඩ ඇත. දෙවැනි වාක්‍යයේදී අප හොඳ විනිශ්චය කරන්නේ, චිත්ත වේගාත්මක අර්ථයෙනි. තුන්වනි වාක්‍යයේදි කෙනෙකුට එය හොඳ ක්‍රියාවක් ලෙසත් තව කෙනෙකු එය නරක ක්‍රියාවක් ලෙසත් හඳුන්වාදීමට පිළිවන. වෛද්‍යවරයෙක් රෝගියෙකුට ඔහුගේ රෝගය සුවවීම සඳහා මත්පැන් එක්තරා ප්‍රමාණයක් ගන්නා ලෙස නියම කරයි. ඔහුගේ නියමය, එම සන්දර්භය තුළ යහපත් වේ. එම ක්‍රියාව වෙනත් සන්දර්භයකදී අයහපත් විය හැකිය. උදාහරණයක් වශයෙන්, ඉහත දක්වන ලද අගැයුම්ශීලි විනිශ්චයන් තුලින් මූලික කරුණක් පැහැදිලි වේ. එනම්, ආචාරාත්මක විනිශ්චයන් විවිධ සන්දර්භයන් තුල, විවිධ අර්ථයන් භාවිතා වන බවයි. මාක්ස්වාදී විග්‍රහයන් තුලින්ද, මීට තරමක් සමාන වන අන්දමේ අදහස් පල කර සිටී. ආචාරාත්මක විග්‍රහයන් සහ විශ්වාසයන් වනාහි සමාජ තත්වය මත ප්‍රභවය වනු ලබන අතර, විවිධ සමාජ තත්වයන්ට අනුව, විවිධ වන බව ඔවුන්ගේ අදහසයි (*Maxism and Ethics-*Kamenka.E.-1919). මේ නිසා සාමාන්‍යයන් තුල ජීවත් වන මිනිසෙක් නොමැති වන අතරම අපට කතා කල හැක්කේ විශේෂ සමාජ පන්තියක් තුල ජීවත් වන විශේෂ මිනිසෙකු ගැන පමණි. ඒ අනුව, සාර්වභෞමික ආචාර ධර්මයක් ගැන අපට කතා කල නොහැක. මාකස්වාදීන් පිළිගන්නා පරිදි, සදාචාරය තීරණය වන්නේ ඒ ඒ යුගවල පන්ති අවශ්‍යතාවන්ගේ ප්‍රතිඵලයක් හැටියට ය (Karl Marx, 1818-1883).

උදා. "සොරකම් කිරීම නරකයි"

මෙවැනි ක්‍රියාවක් සදාචාරය ලෙස තීරණය වන්නේ, සමාජ ආකෘතිය සකස් වී ඇති ආකාරයට අනුව බව මාක්ස්වාදීන්ගේ අදහසයි. එසේම ඔවුන් සදාචාරය හඳුන්වා ඇත්තේ. එය සමාජ ක්‍රමයේ වෙනස්වීමත් සමගම වෙනස් වීමට භාජනය වන්නක් ලෙසය. මාක්ස්වාදය පැහැදිලි කරන තවත් කරුණක් නම්, මිනිස් සංහතියේ විමුක්තියට තුඩු දෙන යමක් ඇත්නම් එය කිරීම වරදක් නොවන බවයි. ඔවුන් පිළිගන්නා පරිදි මෙම විමුක්තිය ලද හැක්කේ විප්ලවයක් මගින් පමණයි. එබැවින් විමුක්තිවාදීන් සදාචාරය තුල අවශ්‍යයෙන්ම විප්ලවවාදී ස්වරූපයක් ගැබ්ව ඇති බව විශ්වාස

කරති. එහෙත් මාක්ස්වාදීන් දක්වන මෙම සදාචාරය මාක්ස්වාදී ධර්මය අදහන්නන්ට පමණක් අදාළ වූවකි. ඒ නිසා මාක්ස්වාදී සන්දර්භය තුල පමණක් එය සීමා වේ. මේ සෑම සන්දර්ශීයක් තුලින්ම පැහැදිලි වන මූලික කරුණ නම්, සදාචාරයට පොදු පදනමක් සැපයිය නොහැකි බවයි. එය විවිධ සන්දර්භයන් තුල, විවිධ අන්දමට භාවිතා විය හැක. එමෙන්ම, සදාචාර විනිශ්චයකට මුල්වන සෑම හේතුවකටම (එය හෘදය සාක්ෂියට චිත්තවේග හෝ ප්‍රතිභාඥානය හෝ වෙනත් මානසික ආකල්පයක් හෝ විය හැකිය) පදනමක් ලැබෙන්නේ මිනිසාගේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය තුලිනි.

මෙසේ සදාචාරයට පොදු පදනමක් සැපයිය නොහැකි වූ නිසා ඇතැම් විද්වතුන් මෙන්ම දර්ශන විචාරකයින් ද සදාචාර විනිශ්චයන් අර්ථශූන්‍ය ප්‍රකාශනයන් යයි කියා ප්‍රතික්ෂේපයට ලක්කර ඇත. නමුත්, අචාරාත්මක විනිශ්චයන්ට පොදු පදනමක් සැපයීම දුෂ්කර වූ පමණින්ම, එම ඇගයුම්ශීලී ප්‍රකාශයන් අර්ථශූන්‍ය ඒවා යයි අපට නිගමනය කල නොහැකිය. ඉහත සඳහන් කළ පරිදි යථානුභූතවාදියෙකු වූ ඒ.ජේ.එයර් (A.J.Ayer –(1910-1989) කියා සිටියේ ඇගැයුම්ශීලී ප්‍රස්තුත අර්ථශූන්‍ය ඒවා වන බවයි. එහෙත්, මෙය පිළිගත හැකිද යන්න ගැටලුවකි. ආචාර විද්‍යාවේ එන ඇගයුම්ශීලි විනිශ්චයන්ගේ අර්ථසම්පන්නභාවය විමැසිය යුත්තේ වෙනස්ම ආකාරයකයට. විශේෂයෙන්ම විස්තරාත්මක ප්‍රස්තුත වල අර්ථ සම්පන්නභාවය අදාල සන්දර්භයෙන් පිටතට ගෙන විශ්ලේෂණය කිරීමට යාම වැරදිය. ආචාර විද්‍යාවේ එන විනිශ්චයන්ට අර්ථසම්පන්නභාවයක් ලැබෙන්නේ, ඒ ඒ ඇගයුම් වලට බලපාන සන්දර්භයන් තුලිනි. සී.ඩී.බ්‍රෝඩ් (C.D.Braod-1887-1977) නැමැති ආචාරවාදියා දක්වන පරිදි, ආචාර ධර්මයෙන් සිදුවනුයේ දේව ධර්මයේ සිදු වනවාට සමාන අන්දමේ කාර්යයකි. (*ආචාර විද්‍යාවේ පංච ප්‍රභේද* -සී.ඩී. බ්‍රෝඩ්) මෙවැනි තත්වයක් ගන්නා ආචාරවාදී විනිශ්චයක් අර්ථවත් කල යුත්තේ අදාල සන්දර්භයක් තුල සිටයි. මෙසේ සන්දර්භයක් ආශ්‍රය කරගෙන ආචාරාත්මක ඇගැයුම් අර්ථකරණය කරන විට, ඒවා වගී කල යුත්තේ කුමන පදනමක් මත පිහිටාද ? යන ප්‍රශ්නය පැන නගී. සදාචාරය මගින් මිනිසා අපේක්ෂා කරණ කාර්යය හා අරමුණ විමැසිම මෙහිදී වැදගත් වේ. ප්‍රාථමික සමාජයක සිට දියුණු සමාජයක් කරා පිය නගන මිනිසා. සදාචාරයෙන් අපේක්ෂා කරන්නේ, සමාජ ප්‍රගතියට ඇති බාධා එමගින් ඉවත් කර සුරක්ෂිතතාවයක් ලබා ගැනීමයි. මේ පදනම මත සිට සදාචාරය දියුණු හා නොදියුණු වශයෙන් වර්ග කල හැකිවේ. වඩාත් සරළ වශයෙන් මේ අදහස පැහැදිලි කළ හොත් "මානුෂිකත්වය" මිණුම ලෙස ගෙන මෙසේ වර්ග කල හැකිය.

විට්ගන්ස්ටෙන් ඔහුගේ *"දාර්ශනික විමර්ෂණ"* (Ludwig Wittgenstein-1889-1951 - *Philosophical Investigation*) කෘතියෙන් කියා සිටියේ භාෂාවේ ඇතැම් වචන වලට පොදු සාරයක් සෙවිය නොහැකි බවයි. ඒවායේ අර්ථය විමැසිය යුතු වන්නේ එය භාවිතා වනු ලබන විවිධ සන්දර්භ ආශ්‍රය කරගෙනයි. මේ අනුව එකම වචනයක් විවිධ සන්දර්භයන් තුල විවිධ ආකාරයට භාවිතා විය හැකිය.

උදාහරණ වශයෙන් විට්ගන්ස්ටෙන් ''ක්‍රීඩා'' යන වචනය යොදා ගෙන ඇත. විවිධ ක්‍රීඩා පැවතුනත් ඒ හැම ක්‍රීඩාවක්ම සමාන ලක්ෂණ නොදරයි. පාපන්දු ක්‍රීඩාවෙහි. එන "ගෝල්" යන වචනය ක්‍රිකට් ක්‍රීඩාවට යෙදිය නොහැකියි. එම ක්‍රීඩා දෙකේ නීතිරීති බැඩ්මින්ටන් ක්‍රීඩාවට යොදාගත නොහැක. ඒ සියළු ක්‍රීඩා තරමක් හෝ එකිනෙකට වෙනස් වේ. එහෙත්, මේ හැම ක්‍රීඩාවකටම අපි ''ක්‍රීඩා" යන වචනය පොදුවේ භාවිතා කරමු. මෙවැනි වචනයක් භාවිතා වන සන්දර්භයන් අතර ඇත්තේ ''පුලුල්" සමානතාවයක් බව විට්ගන්ස්ටයින් විසින් දක්වා ඇත. (Ludwig Wittgenstein (1898-1951) Wittgenstein's early work (*Tractatus*) was concerned to examine the limits to knowledge, linking it closely with what could be verified by experience, Later he broadened his understanding of meaning, taking into account the different ways in which language is used.)

මෙවැනි පුලුල් සමානතාවයක් දක්වන වචනයකට පොදු සාරයක් සෙවිය නොහැකිය. ආචාර විද්‍යාවේ එන ඇගයුම්ශීලි විනිශ්චයන්ටද මෙම සන්දර්භය අදාල වේ. සදාචාරාත්මක විනිශ්චයන් විවිධ සංදර්භයන් තුල විවිධ අර්ථයෙන් භාවිත වන බවත් එම විනිශ්චයන්ගේ අර්ථසම්පන්නභාවය එම සන්දර්භයන් තුලින්ද තිරණය වන බවත් කිව හැකිය. මේ අනුව, ආචාරවිද්‍යාවේ එන ඇගයුම්ශීලී ප්‍රස්තුතයන් එහි දැක් වූ අන්දමේ අර්ථ ශුන්‍ය ප්‍රකාශනයන් නොවන අතර ඒ වායේ අර්ථ සම්පන්නභාවය තීරණය කිරීමට කලින් සඳහන් කරන ලද පරිදි ඒ ඒ සන්දර්භයන් කරා යා යුතුය. ඇගයුම්ශීලී කරුණු මානසික ආකල්පයන් හා සම්බන්ධ වන නිසා, සදාචාරය විවිධ සමාජයන්ට විවිධ විය හැකිය. එහෙත්, විවිධ සන්දර්භයන් තුළ සදාචාරය තීරණය කරනු ලබන කරුණු (ප්‍රතිභාඥානය, චිත්තවේග, හෘද සාක්ෂිය වැනි) වලට බලපාන පාදක කරුණු විග්‍රහ කළ යුතු වන්නේ අදාල සමාජ සන්දර්භයන් ආශ්‍රය කර ගෙනයි. ආචාරාත්මක විනිශ්චයන් දෙස සුපරික්ෂාකාරීව බලන විට ඒවාට මුල් වන පදනම ප්‍රමාණික ආචාරවාදීන් දැක් වූ අන්දමේ සරල විදිහේ දෙයක් නොවේ. සදාචාරය වූ කලී මිනිසා ජීවත් වන සමාජය තුල විවිධ සන්දර්භයන්ට ප්‍රායෝගික වයෙන් මුහුණ දීමෙන් ඔහු ලබන දැනීම ආශ්‍රයෙන් තීරණය වන්නක් බව කිව හැකිය. එසේම මිනිස් සමාජය තුළින්ම වැඩි, වර්ධනය වෙමින්ද, අත්හැරී ප්‍රතික්ෂේප වෙමින් ද සමාජයේ ම කොටසක් ලෙස සැමකල්හිම පවතින්නක් ද වේ.

**පාදක සටහන්**


1. Ayer, A.J. *Language, Truth and Logic*, Vitor Gollannz Ltd, London, 1936.
2. Stevenson, C.L., *Facts and Values: Studies in Ethical Analysis*, Praeger 1975.
3. Moor,G.E., *Principia Ethics*, Cambridge University Press, 1903.
4. Frankena, W.K., *Ethics*, Prentice Hall,U.S.A., 1963.
5. Witgenstein, L., *Philosophical Investigation*,Basil Blakwell, Oxford, 1953.
6. Witgenstein, L., *Tractatus Logico Philosophicus*, Routlegde & Kegan Paul,1961.
7. Thompson,M., *Ethical Theory*, Hodder Education, London,2008.
8. Broad,C.D., *Ethics and the History of Philosophy: Selected Essays*, 1952.
9. Broad,C.D., *Five Types of Ethical Theory*, 1950.
10. Thompson,M., *An Introductin to Philosophy & Ethics*, Hodder Education, London,2003.
11. Mel Thopmson, Etical Theory, Hodder Education, London, 2008
12. Kamenka,E., *Marxism and Ethics*, London, McMillon, 1919.
13. Marx.K., *German Ideology*, Moscow, Progress Publication,1976.
14. බ්‍රෝඩ්,සී.ඩී.(1966), *ආචාර ධර්මයේ පංචවිධ ප්‍රභේද*, කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.
15. මැකන්සි,ජේ.එස්.(1969), *ආචාර ධර්මයේ අත්පොත*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
16. ප්‍රේමසිරි, පී.ඩී., *ආචාර විද්‍යාව*, චතුර මුද්‍රණාලය,වැල්ලම්පිටිය, 1998.